© ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

## වතු කම්කරුවන්ට සහනාධාර ලෙස තිරිඟු පිටි බෙදා දීම

වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ සම්බන්ධිකරණය යටතේ අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය යටතේ ඇති ලංකා සතොස ආයතනය මගින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශාන්ත කූම්බ්ස් වත්ත, තලවකැලේ සහ ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර යන වතු දෙකෙ හි වතු කම්කරු පවුල් වෙත නොමිලයේ ලබා දීම සඳහා මෙට්‍රික් ටොන් 03 ක තිරිගු පිටි තොගයක් පසුගිය දා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයනය වෙත ලබා ගන්නා ලදී.

කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් වතු අංශයේ දෛනික ඉපැයීම් අහිමිවූ අඩු ආදායම්ලාභී වතු කම්කරුවන් අතර ඇතිවිය හැකි ආහාර හිඟය පියවා ගැනීම සඳහා සහන පියවරක් ලෙස අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය යටතේ ලංකා සතොස ආයතනය සහ තිරිඟු පිටි සැපයුම්කරුවන්ගේ අනුග්‍රහයෙන් මෙය ආරම්භ කර ඇත.

සිංහල සහ දමිල නව වසරට පසු ලංකා සතොස ආයතනය මගින් කරන ලද මෙම කාලෝචිත ක්‍රියාව, තලවකැලේ සහ ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර අඩු ආදායම්ලාභී පවුල්වලට මහත් සහනයක් විය. එමඟින් ඔවුන්ගේ දෛනික ඉපැයීම් අහිමි වීමට සහනයක් විය.

එම තිරිගු පිටි එක් පවුලකට කිලෝ 03ක් පමණ වන සේ තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයාය හි පවුල් 632 ක් අතර සහ රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ පවුල් 264 ක් අතර බෙදා දීම සිදු කරන ලදී. තව ද තේ පර්යේෂණ ආයතනයේ මහනුවර, පස්සර, කොට්ටව සහ දෙනියාය යන ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට අනුයුක්තව සේවය කරන සේවක පවුල්වලට ද මෙම සහනාධාරය ඉදිරියේ දී බෙදා දීමට නියමිතය.



ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර




ශාන්ත කූම්බ්ස් වත්ත, තලවාකැලේ

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ද එක්ව ලංකා සතොස ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, දුෂ්මන්ත තොටවත්ත මහතා විසින් මෙම කාර්යය සම්බන්ධීකරණය කිරීම තුළින් සාර්ථකව සිදු කිරීම සඳහා ලබා දුන් සහයෝගය වෙනුවෙන් කෘතඥතාවය පළ කර සිටින අතර වතු අංශයේ අඩු ආදායම්ලාභී පවුල්වලට අලුත් අවුරුදු සමයේදී ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මේ මගින් ප්‍රතිලාභ ලබා දී තිබේ.